**2021 පෙබරවාරි මස 19 වන දින පැවති**

**තිස් හතර වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2021.02.19**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **10.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **11.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **12.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | (එ.ජා.ප) |
| **13.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **14.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **15.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **16.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **17.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **18.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **19.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **20.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **21.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින් ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**2020.01.25 මහ සභා කෙටුම්පත් වාර්ථාව**

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා 2021.01.25 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම්

සංශෝධනයන්ට යටත්ව හෝ සංශෝධන නොමැති නම් සංශෝධන රහිතව වාර්ථාව සහා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.01.25 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>සංශෝදන</u>

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> 16 වන පිටුවේ <u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයෙක් ලෙස මේ වන විට වසර 20 ක කාලයක් එක දිගට රැදී සිටිමින් දැක්වූ සහයෝගය හා කැපවීම වෙනුවෙන් තම ස්තූතිය ගෞරවයෙන් පුද කරන බව ප්‍රකාශ කරමින් එතුමා වෙත සමරු තිළිණයක් ගරු සභාවට කැදවා ලබා දීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී. යන්න <u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයෙක් ලෙස මේ වන විට වසර 20 ක කාලයක් එක දිගට රැදී සිටිමින් දැක්වූ සහයෝගය හා කැපවීම වෙනුවෙන් **ගරු මන්ත්‍රී බී.කේ අශෝක විමලසිරි මැතිතුමා වෙත** තම ස්තූතිය ගෞරවයෙන් පුද කරන බව ප්‍රකාශ කරමින් එතුමා වෙත සමරු තිළිණයක් ගරු සභාවට කැදවා ලබා දීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී. ලෙසට සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> 2021.01.25 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්ථාවේ තමන් පෙ.ව 10.05 ට මහ සභාවට පැමිණ අසුන් ගත් බවට සඳහන් වුවත්, තමන් ගරු සභාපතිතුමා පැමිණීමටත් පෙර සිටම මහ සභාවේ රැදී සිටි බැවින් එය ඉවත් වී සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

තවද ලේකම්තුමා විශේෂ රාජකාරි කටයුත්තක් සඳහා සහභාගී වූ බැවින් මෙදින මහ සභාවට සහභාගී නොවන නිසා ඒ සඳහා තාවකාලික ලේකම්වරිය ලෙස නයෝමී වීරකෝන් මහත්මිය නම් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී. යන්න ලේකම්තුමා විශේෂ රාජකාරි කටයුත්තක් සඳහා සහභාගී වූ බැවින් මෙදින මහ සභාවට සහභාගී නොවන නිසා ඒ සඳහා තාවකාලික ලේකම්වරිය ලෙස සභා රැස්වීමේ රාජකාරි ආවරණය කිරීම වෙනුවෙන් නයෝමී වීරකෝන් මහත්මිය නම් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී ලෙසට සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා වරිපනම් බදු අය කිරීම සිදු කල නොහැකි බවට සඳහන් කිරීම සහා ආදායම් අහිමි කර ගැනීමක් බවත්, ජනතාවගේ කැමැත්ත ප්‍රකාශ කර තිබියදී, එලෙස සටහන් කිරීම සුදුස නොවන බවත්, ඉල්ලීම කල ප්‍රෙද්ශය තුල වරිපනම් අය කර ගැනීම සඳහා කටයුතු කල යුතු බව සඳහන් කරමින්, 2021.01.25 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්ථාව ,සංශෝධන වලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු උප සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021.01.25 වන දින පැවති මහ සභා කෙටුම්පත් වාර්ථාව ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

**01.** **නිවාඩු දැනුම් දීම.**

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා, ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය, ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් ලිපි මහ සභාවට නිවේදනය කරන ලදී.

**02. අධිකරණය වෙත පැමිණෙන මහජනතාව වෙනුවෙන් පොදු පහසුකම් සැපයීම.**

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අතිගරු ජනාධිපතිතුමාගේ "රට හදන සෞභාග්‍ය යේ දැක්ම" යටතේ ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභාව යන සීමා තුල ක්‍රියාත්මක කල යුතු නිශ්චිත ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය බලතල පළාත් පාලන ආයතන වලට ලබා දී ඇති බවත්, මෙම පළාත් පාලන ආයතන මගින් පොදු මහජන අවශ්‍යතා සැලසුම් කිරීමේදි අධිකරණ ක්ෂේත්‍රය පිළිබඳ අඩු අවධානයක් යොමු කර ඇති බවත්, අධිකරණ මගින් උසාවි දඩ මුදල් වශයෙන් විශාල දඩ මුදල් ප්‍රමාණයක් අයකර අදාල පළාත් පාලන ආයතන වෙත ලබා දී තිබුනත්, අධිකරණ ක්ෂේත්‍රයේ පොදු පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අදාල පළාත් පාලන ආයතනයන් සිය අවධානය යොමුකර නොමැති බැවින් උසාවි දඩ මුදල් ලෙස ඔබ ආයතනයට ලැබෙන ආදායම් මුදලින් බල ප්‍රදේශ තුල පිහිටි අධිකරණ පරිශ්‍රයන් පොදු පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වැඩි අවධානය යොමු කරන මෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කර තිබූ ලිපිය මහ සභාවට නිවේදනය කරන ලදී.

තවද මෙම බල ප්‍රදේශය තුල අධිකරණ සංකීර්ණයක් නොමැති බැවින් මේ පිළිබඳ අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවයක් පවතින්නේද යන්න සළකා බැලිය යුතු බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මෙම බල ප්‍රදේශය තුල අධිකරණ නොපැවතියා වුවත්, අධිකරණය මගින් පනවන උසාවි දඩ ඔස්සේ මෙම සභාවට උසාවි දඩ මුදල් ආදායම් ලෙස ලැබීමට සලස්වන බැවින්, පොදු පහසුකම් හඳුනාගෙන තක්සේරු කර උසාවි දඩ සඳහා අයිතිවාසිකම් හිමි වන පළාත් පාලන ආයතන සමඟ සමසේ බෙදා මෙම ප්‍රාදේශීය සභාවට අයත් කොටස යොමු කරන ලෙසට ඉල්ලීමක් කර පිළිතුරු ලිපියක් යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

තවද මුද්දර ගාස්තු සභාවට හිමි වීමේදී යම් මුදලක් දිරි දීමනාවක් ලෙස රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නිළධාරීන් වෙත යොමු කරන නමුත් උසාවි දඩ මුදල් ලබා දීමේදී එවැනි ගාස්තුවක් අය නොකරන බැවින් උසාවි දඩ ඔස්සේ අධිකරණ පරිශ්‍රයක පොදු පහසුකම් සැබයීම ගැටළුවක් නොවන බවත්, සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා අධිකරණය යනු මහජන මුදලින් නඩත්තු වන ආයතනයක් බැවින් එහි යටිතල පහසුකම් සැපයීම මධ්‍යම ආණ්ඩුවේ වගකීමක් වන බවත්, මෙහි අවශ්‍යතාවයන් ඉටු කිරීමේ අවශ්‍යතාවයක් පවතින්නේද යන්න ගැටළු සහගත බවත්, නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි ආයතනයක් බැවින් එය නගර සභාව ඉටු කල යුතු බවත්, අධිකරණ ආයතනය ස්වාධීනත්වය සුරුකීම වෙනුවෙන් මෙම කාර්යය ඉටු කල යුතු නැති බවත්, තමන්ගේ අදහස බව ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා පෙ.ව 10.15 මහ සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා මෙම ලිපිය පොදුවේ පළාත් පාලන ආයතන සියල්ල වෙත යොමු කල ලිපියක් බැවින් මෙම සභා බල ප්‍රදේශයේ අධිකරණයන් පිහිටා නොමැති නිසා මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කල යුතු නැති බවත්, ඉදිරියේදීත් නැවතත් මෙවැනි ඉල්ලීමක් ලද හොත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කල හැකි බව සඳහන් කරන ලදී.

**03. 2021 වර්ෂය සඳහා ස්ථානීය බදු දීම.**

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා 2021 වර්ෂයේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථානීය බදු දීම් සම්බන්ධ විස්තකරය මහ සභාවට නිවේදනය කරන ලදී.

| අනු අංකය | බඳු ස්ථානය |
|---|---|
| | **මස් කඩ** |
| 01 | අතුරුවැල්ල එළ ගව මස් කඩය |
| 02 | කුඩා නෙළුබැව එළ ගව මස් කඩය |
| | **මාළු ලැලි** |
| 01 | කුඩා නෙළුබැව පොළ භූමිය මුහුදු මාළු ලැල්ල |
| 02 | උණගස්වැව මංසන්ධියේ මුහුදු මාළු ලැල්ල |
| 03 | විජයපුර මංසන්ධිය වැව් මාළු ලැල්ල |
| 04 | ශ්‍රාවස්තිපුර මංසන්ධියේ මුහුදු මාළු ලැල්ල |
| 05 | නෙළුම්කුලම මංසන්ධියේ පොඩි ඇළ අසල වැව් මාළු ලැල්ල |
| 06 | ආලංකුලම වැව ඉදිරිපිට වැව් මාළු ලැල්ල |
| 07 | කුඩා නෙළුබැව පොළ භූමියේ වැව් මාළු ලැල්ල |
| 08 | පාලාඩිකුලම මංසන්ධියේ වැව් මාළු ලැල්ල |
| 09 | 5 ඇල මංසන්ධියේ වැව් මාළු ලැල්ල |
| 10 | නාච්චාදූව මංසන්ධියේ මුහුදු  මාළු ලැල්ල |
| 11 | ඥාණික්කුලම 3 කණුව වංගුව අසල වැව් මාළු ලැල්ල |
| 12 | නෙළුම්කුලම මංසන්ධියේ මහ ඇල අසල මාළු ලැල්ල |
| 13 | මොරගොඩ අසල මාළු ලැල්ල |
| | **කඩ කාමර හා නිවාඩු නිකේතන** |
| 01 | කවරක්කුලම කඩ කාමර අංක 01 |
| 02 | කවරක්කුලම කඩ කාමර අංක 02 |
| 03 | කවරක්කුලම කඩ කාමර අංක 03 |
| 04 | කවරක්කුලම කඩ කාමර අංක 04 |
| 05 | කවරක්කුලම කඩ කාමර අංක 05 |
| 06 | කවරක්කුලම කඩ කාමර අංක 06 |
| 07 | ශ්‍රාවස්තිපුර අංක 08 කඩ කාමරය |
| 08 | ශ්‍රාවස්තිපුර අංක 09 කඩ කාමරය |
| 09 | ප්‍රාදේශීය සභා කඩ කාමර අංක 06 |
| 10 | තුරුලිය සෙවන නිවාඩු නිකේතනය |
| 11 | ජයබිම උත්සව ශාලාව |
| | **ජංගම වෙළඳ කුටි** |
| 01 | පොතානේගම මංසන්ධියේ ජංගම වෙළඳ කුටිය |
| 02 | මහ පාලාඩිකුලම වෙළඳ කුටිය |
| 03 | ප්‍රාදේශීය සභා මංසන්ධියේ වෙළඳ කුටිය |
| 04 | විජයපුර මංසන්ධියේ ජංගම වෙළඳ කුටිය |
| 05 | බණ්ඩියාලංකුලම ජංගම වෙළඳ කුටිය |
| 06 | 2 කණුව රත්නායක මාවත ජංගම වෙළඳ කුටිය |
| 07 | කම්කරු මාවත ජංගම වෙළඳ කුටිය |
| 08 | 7 ඇළ මංසන්ධියේ ජංගම වෙළඳ කුටිය |
| 09 | ශ්‍රමදාන මාවත ජංගම වෙළඳ කුටිය |
| 10 | කලත්තැව වානේ කඩේ හංදිය ජංගම වෙළඳ කුටිය |
| 11 | කීරික්කුලම මංසන්ධියේ ජංගම වෙළඳ කුටිය |

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා තුරුළිය සේවන නිවාඩු නිකේතනය බදු දීමේදී ඒ සම්බන්ධයෙන් වන කොන්දේසි සභා ගත කලත්, ජයබිම උත්සව ශාලාව බදු දීමට අදාල බදු කොන්දේසි මහ සභාවට ඉදිරිපත් නොකල බැවින් එය ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා 2020 ජනවාරි මස මහ සභාවේදී ජයබිම උත්සව ශාලාව බදු දීමට අදාල කොන්දේසි ඉදිරිපත් කර තිබෙන නමුත් එහිදී කිසිදු විරෝධතාවයක් හෝ සංශෝධනයක් ඉදිරිපත් නොවූ බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා සාමාන්‍යයෙන් දේපලක් බදු දීමේදී දේපල වල ස්වාභාවය, ස්ථානය යනාදි කරුණු කාරණා අධ්‍යයනය කර කොන්දේසි සකස් කල යුතු බවත්, තුරුළිය සෙවන නිවාඩු නිකේතනයේ කොන්දේසිම ජයබිම උත්සව ශාලාවේ කොන්දේසි වලට ඇතුලත් කල නොහැකි බව සඳහන් කරන ලදී.

තවද ජයබිම උත්සව ශාලාව අළුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් කමිටුවට ඉදිරිපත් කර ඇති ද්‍රව්‍ය සඳහා වූ මිල ගණන් අනුව ගෙවීම් කිරීමේ හැකියාව පවතින්නේද යන්න විමසන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා අදාල අළුත්වැඩියාවන් සිදු කල යුතුව පැවතියේ ජයබිම උත්සව ශාලාව බදු දීමට ප්‍රථම වුවත් එම අළුත්වැඩියාවන් සිදු කිරීම සිදු නොකල බැවින් අළුත්වැඩියාවන් වලට අදාල ද්‍රව්‍ය මිල දී ගැනීමට කටයුතු කරන බවත්, මින් ඉදිරියට කොන්දේසි වලට පරිභාහිරව කිසිදු අළුත්වැඩියාවක් සිදු නොකරන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා කඩ කාමර හා නිවාඩු නිකේතන බදු දීමේදී, යම් තක්සේරුවක් සිදු කල අඩුපාඩු හඳුනාගෙන අදාල අළුත්වැඩියාවන් සිදු කර අවසන් කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලද අතර එසේ නොවුනහොත් බදුකරු විසින් සිදු කරන හානි පවා ප්‍රාදේශීය සභාවට දැරීමට සිදු වන බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා යම් අළුත්වැඩියාවක් සිදු කිරීම සම්බන්ධව කොන්දේසි ඇතුලත් කර නොමැතිනම් එය විශාල වැරද්දක් බව කරුණු දක්වමින් ප්‍රකාශ කරන ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත**

**ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා 2021.02.10 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**I. ප්‍රාදේශීය සභාවට අයත් ජයබිම උත්සව ශාලාවේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම.**

ප්‍රාදේශීය සභාවට අයත් ජයබිම උත්සව ශාලාවේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කරන ලද මිල ගණන් අතරින් ජයබිම උත්සව ශාලාවේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 90, මහ වීදිය, අනුරාධපුර ලිපිනයේ පිහිටි මහජන හාඩ්වෙයාර් වෙතින් සම්පූර්ණ වටිනාකම රු 23540.00 යටතේ මිල දී ගැනීම සඳහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**II. ප්‍රාදේශීය සභා කාර්යාලයට අවශ්‍ය ප්‍රින්ටර් මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභා කාර්යාලයට අවශ්‍ය ප්‍රින්ටර් මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල කමිටුවට ඉදිරිපත් කරන ලද අතරකැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 0981/448, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර ලිපිනයේ පිහිටි වයිෆයි සෝන් කම්පියුටර් ටෙච්නොලජීස් (පුද්) සමාගම වෙතින් සම්පූර්ණ වටිනාකම රු 31000.00 කට Printer Lazer Pentum p2500 වර්ගයේ ප්‍රින්ටර් යන්ත්‍ර දෙකක් මිල දී ගැනීම සඳහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**III. ප්‍රාදේශීය සභා කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රය වෙනුවෙන් අවශ්‍ය ටෝනර් මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභා කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රය වෙනුවෙන් අවශ්‍ය ටෝනර් මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 0981/448, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර ලිපිනයේ පිහිටි වයිෆයි සෝන් කම්පියුටර් ටෙච්නොලජීස් (පුද්) සමාගම වෙතින් කාර්යාලයට අවශ්‍ය ටොෂිබා 2309 එච්.ඊ 6545 වර්ගයේ ටෝනර් 03 ක් සම්පූර්ණ වටිනාකම රු 43,500 කට මිල දී ගැනීම සඳහා මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**IV. ප්‍රාදේශීය සභා පෙරටු කාර්යාලයට අවශ්‍ය වායු සමීකරණ යන්ත්‍ර මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභා පෙරටු කාර්යාලයට අවශ්‍ය වායු සමීකරණ යන්ත්‍රය මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් 2021.01.13 වන දින පැවති මුදල් කමිටුවට ඉදිරිපත් කල මුත්,මාදිලි හා අනෙකුත් තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් මුදල් කමිටුවේ නිර්දේශයක් ලබා දිය නොහැකි බැවින් කැඳවන ලද මිල ගණන් තාක්ෂණික කමිටුවක් වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය හා මහ සභාවේ අනුමැතිය ලබා දෙන ලදී ඒ අනුව එහි තාක්ෂණික කමිටුව ලෙස,

යාන්ත්‍රික ඉංජිනේරු නෙරංජන් ධනපාල මහතා

ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරී ආර්.එම්.සී.ජේ.කේ රාජපක්ෂ මහතා

ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ සහයක තරංග නිසාසිරි මහතා පත් කිරීම සුදුසු බවට මෙවර මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී. ඒ අනුව තාක්ෂණ කමිටු වාර්ථාව සැළකිල්ලට ගෙන ඒවා ඇති අවම මිල ගණන් යටතේ මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

## V. ප්‍රාදේශීය සභාවේ ගරු සභිකවරුන්, ගරු සභිකවරියන් හා සභා කටයුතු සිදු කරනු ලබන නිළධාරීන් සඳහා කාර්යාලීය අවශ්‍ය බෑග් මිල දී ගැනීම.

ප්‍රාදේශීය සභාවේ ගරු සභිකවරුන්, ගරු සභිකවරියන් හා සභා කටයුතු සිදු කරනු නිළධාරීන් සඳහා අවශ්‍ය කාර්යාලීය බෑග් මිල දී වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 136, ප්‍රධාන වීදිය, අනුරාධපුර ලිපිනයේ පිහිටි ස්ටාර් ෆැන්සි වෙතින් විශාල ප්‍රමාණයේ බෑග් (පිරිමි) හා කුඩා ප්‍රමාණයේ බෑග් (කාන්තා) බෑග් සම්පූර්ණ වටිනාකම රු 76,200.00 කට මිල දී ගැනීම සුදුස බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

## VI. පෙරටු කාර්යාලය සඳහා අවශ්‍ය සිවිලිං විදුලි පංකාව මිල දී ගැනීම.

ප්‍රාදේශීය සභා පෙරටු කාර්යාලයේ සවි කිරීම සඳහා අවශ්‍ය විදුලි පංකාව මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 122, බැංකු පෙදෙස, අනුරාධපුර ලිපිනයේ පදිංචි ශශී ඉලෙක්ට්‍රිකල්ස් වෙතින් සම්පූර්ණ වටිනාකම රු 8,975.00 කට ප්‍රාදේශීය සභා පෙරටු කාර්යාලයේ සවි කිරීම සඳහා අවශ්‍ය විදුලි පංකාව මිල දී ගැනීම සුදුස බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

## VII. ට්‍රැක්ටර් රථය සඳහා සවි කල හැකි තණකොළ කපන යන්ත්‍රයක් මිල දී ගැනීම.

ට්‍රැක්ටර් රථය සඳහා සවි කල හැකි තණකොළ කපන යන්ත්‍රයක් මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති මිහින්තලා පාර, රඹෑව ලිපිනයේ පිහිටි ඒ.වී.පී මෝටර්ස් වෙතින් **දැති (plate) දෙක සහිත ට්‍රැක්ටර් pto Speed 540 සහිත හෝස් පවර් 40 ත් 50 ත් අතර** ට්‍රැක්ටරයට සවි කල හැකි තණකොළ කපන යන්ත්‍රය සම්පූර්ණ වටිනාකම රු 205000.00 කට මිල දී ගැනීමබ සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

## VIII. කාර්යාලය සඳහා අභ්‍යන්තර දුරකථන ජාලය හඳුන්වා දීම.

කාර්යාලය සඳහා අභ්‍යන්තර දුරකථන ජාලය හඳුන්වා දීම සඳහා තාක්ෂණ උපදේශක කමිටුවේ නිර්දේශ අනුව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් ලබා ගත් ඊට අදාල ඇස්තමේන්තුව මුදල කමිටුවට ඉදිරිපත් කරන ලද අතර අදාල සම්බන්ධතාවය ලබා ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

| | |
|---|---|
| ප්‍රධාන දුරකථනයේ සිට උප දුරකථන 05 ක් සම්බන්ධ කිරීම සඳහා වයරින් සමඟ සම්බන්ධිත ගාස්තුව | 221,322.24 |

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> කාර්යාලය සඳහා අභ්‍යන්තර දුරකථන ජාලය හඳුන්වා දීම සම්බන්ධයෙන් තමන් යෝජනා ඉදිරිපත් කළේ, 2014 වර්ෂයේ සිට වුවත්, මේ වන විට එය ඉටු කර ගැනීමට සූදානම් වන බවත්, එයින් මෙම ප්‍රාදේශීය සභාව කොතරම් මන්දගාමීව සංවර්ධනය කරා යොමු වන්නේද යන්න පැහැදිලි වන බව සඳහන් කරන ලද අතර පසුවට හෝ එම තීරණයට එළඹීම සම්බන්ධයෙන් තමන් සතුටු වන බව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> මෙම සභා කාර්යාලය සඳහා අභ්‍යන්තර දුරකථන ජාලය හඳුන්වා දීමේ අවශ්‍යතාවය මතු වූයේ ඉහල මහල ඉදි කිරීමත් සමඟ වන බවත්. මීට ඉහතදී ඉහල මහල තිබුනා වුවත්, එහි භාවිතය අඩු වූ බැවින් දුරකථන ජාලයක අවශ්‍යතාවයක් නොතිබූ බවත්, මේ වන විට පෙරටු කාර්යාලය ආරම්භ කර ඇති බැවින් අභ්‍යන්තර දුරකථන ජාලය හඳුන්වා දීම අත්‍යාවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා 2021.02.10 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු උප සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා 2021.02.10 වන දින මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021 පෙබරවාරි මස මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**02. 2021 මාර්තු මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා 2021 මාර්තු මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**2021 පෙබරවාරි**

| | | පැය ගණන |
|---|---|---|
| 01. ටී.එන් අමරතුංග මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එච්.එම්.එස්.ඩී චන්ද්‍රසිරි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 03. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 04. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 50 |
| 05. එස්.පී.එම් පුෂ්පකුමාරි මිය | (පුස්තකාල සහයක) | 40 |
| 06. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහයක) | 40 |
| 07. ඩබ් තිලකරත්න මයා | (කා.කා.ස) | 40 |
| 08. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 09. ඒ.ඒ පියතිස්ස මයා | (මුරකරු) | 75 |
| 10. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 75 |
| 11. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 12. ජේ.එම්.ජේ.ආර්.කේ ජයසුන්දර | (විදුලි කාර්මික) | 40 |
| 13. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 14. ඩී.එම් ගුණරත්න බංඩා මයා | (කා.කා සහයක) | 75 |
| 15. සුහාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 40 |
| 16. පියල් බුද්ධික මයා | (අනියම් මාර්ග කම්කරු) | 40 |
| 17. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 40 |

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා 2021 මාර්තු මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු උප සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සම්බන්ධව යම් විරෝධතාවයන් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2021 මාර්තු මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** ගලි බවුසරය වෙත මුදල් ගෙවූ නමුත් කාර්යය සිදු නොකිරීම මත අදාල මුදල නැවත ගෙවීම.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා නාච්චාදූව, කඩ වීදිය ලිපිනයේ පදිංචි අබුසාලි අන්වර් සදාත් යන අය විසින් 2021.02.08 වන දින 508 දරණ ලදුපත් අංකයෙන් ගලි බවුසරය කුලියට ගැනීම වෙනුවෙන් රු7296 ක් ගෙවීම් කර ඇතත් එම කාර්යයන් ඉටු නොකිරීම මත එම මුදල නැවත ඉල්ලීම් කර ඇති බව සඳහන් කර ආදායම් නැවත ගෙවීමට අදාල එල්.ජී 32 ආකෘති පත්‍රය සභා ගත කරන ලද අතර එම ගාස්තු නැවත ගෙවීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා අදාල කාර්යය ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය සභාව මගින් අවස්ථා දෙකකදී උත්සහ කර තිබුනත්, එය පස් තත්වයේ පවතින බැවින් සිදු කල නොහැකි වූ බවත්, අදාල කාර්යයට නියමිත ප්‍රවාහන ගාස්තුව හා සේවක දිරි දීමනාව අඩු කර ගනිමින් ඉතිරි මුදල ගෙවීම සුදුසු බවට ගරු උප සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ගලි බවුසරය වෙත මුදල් ගෙවූ නමුත් කාර්යය සිදු නොකිරීම මත ගෙවිය යුතු මුදල දිරි දීමනා හා ප්‍රවාහන ගාස්තු රඳවාගනිමින් නැවත ගෙවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාව සඳහා දෛනික දීමනාවක් ලබා දීම.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා වන්නියම්කුලම, විශාකා මාවත, අංක 79 ලිපිනයේ පදිංචි ඩබ්.එම් නිරෝෂණී යන අය විසින් තමන් දැනට නැ.නු.ප ප්‍රාදේශීය සභාවේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ සහයක පාලිකාව ලෙස වසර දෙකකට ආසන්න කාලයක් සේවයේ යෙදෙමින් සිටින බවටත්, දරුවන්ගේ පැමිණීමේ ප්‍රමාණය අනුව තමාගේ හා අනෙකුත් පාලිකාවගේ වැටුප තීරණය වන බවත්, එහිදී හිමි වන මුදල පවතින ජීවන බරත් සමඟ ගැටීමට තරම් ප්‍රමාණවත් නොවන බවත්, මෙම සේවාව අත්‍යාවශ්‍ය සේවාවක් වන අතර පාලිකාවක් වශයෙන් ඉතා වගකීමෙන් හා ආදරයෙන් යුතුව දරුවන් රැක බලා ගන්නා බවත්, තමා මෙම සභාවේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ සේවයේ යෙදෙන බවට මා හට කිසිදු ලිඛිත ලියවිල්ලක්වත්, නොමැති බවත්, පවතින අපහසුතා මත දෛනික දීමනාවක් හෝ ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට යෝමු කර තිබූ ලිපිය මහ සභාවට ඉදිරිපත් කරමින්, මේ සම්බන්ධයෙන් නෛතික හැකියාවක් නොමැති බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමේ හැකියාව තිබුනා වුවත්, ඒ සඳහා සේවකයෙකු බඳවා ගෙන දෛනික වැටුපත් හෝ ලබා දීමේ හැකියාව අහිමි වන්නේ මන්ද යන්නත්. ඔවුන් වෙනුවෙන් සිදු කල හැකි සාධාරණත්වය කුමක්ද, මේ වන විට ඔවුන් වෙත දෛනික වැටුපක් ගෙවීමට පවතින බාධාව කුමක්ද යන්නත්, මොවුන් වෙනුවෙන් දෛනික වැටුපක් හෝ ලබා දීමට සභාව මැදිහත් විය යුතු බව තමන්ගේ අදහස බව ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිනිය පෙ.ව 10.40 මහ සභාවෙන් පිටව යන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මුදල් රෙගුලාසි 71 යටතේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය සභාවට අදාල තනතුරු අනුමත කර නොමැති බැවින් අනියම් පත්වීමක් හෝ ලබා දීමට නොහැකි වුවත් ප්‍රාදේශීය සභාව ලාභ ලබන ආයතනයක් නොව ජනතාවට සේවය සලයන ආයතනයක් වන බැවින් ගුණාත්මක භාවයෙන් යුතු දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන්නේ නම් දරුවන් ඇතුලත් වීම වැඩි වන බවත්, එලෙස ගුණාත්මක සේවයක් සැපයීමට නම් සුදුසු වැටුපක් අදාල පාලිකාවන් වෙත හිමි විය යුතු

බවත්, මෙම ඉල්ලීම සිදු කල පාලිකාව වෙනුවෙන් සභාව කිසිදු කටයුත්තක් සිදු නොකල බැවින් ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තිය යටතේ සේවයේ අවශ්‍යතාවය මත අදාල පාලිකාව සේවයේ යොදවා ගැනීමේ හැකියාවක් හා පත්වීමක් ලබා දීමේ හැකියාව පවතින බවත්, සඳහන් කන ලදී.

තවද මෙහිදි ආදේශක තනතුරක් ලබා දී දින 180 සම්පූර්ණ වීමෙන් පසු ස්ථිර කිරීමේ හැකියාව පවතින බවත්, මුරේ 71 සඳහා අනුමැතිය හිමි වන තුරු අදාල පාලිකාවට ආදේශක කම්කරු පත්වීමක් ලබා දී දෛනික වැටුප් ගෙවීමක් සිදු කල හැකි බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> මෙම සභාව රාජ්‍ය ආයතනයක් වන බැවින් ලිපිය ප්‍රකාරව ලිඛිත ගියවිල්ලක් ලබා දී නොමැති ව වසර දෙකකට ආසන්න කාලයක් අදාල සේවිකාව රාජකාරි සිදු කළේ කෙසේද යන්න විමසන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> දිවා සුරැකුම් මධ්‍යස්ථානය ප්‍රාදේශීය සභාව යටතේ පැවතියා වූවත්, මෙතෙක් මු.රේ 71 අනුව තනතුරු අනුමත වී නොමැති බැවින් තනතුර අනුමත කරන තාක් කල් ඒ වෙනුවෙන් සේවකයෙකු බඳවා ගත නොහැකි වන බවත්, දැනට සිටින ප්‍රධාන පාලිකාවද සේවයේ යොදවාගෙන සිටින අයෙකු බවත්, පෙර පාසල පවත්වාගෙන යාමේදී ඒ සඳහා සහය පාලිකාවන් බඳවා ගෙන ප්‍රධාන ගුරුතුමියගේ වැටුපෙන් ගෙවීම් කරනවා සේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ පාලිකාවන් දෙදෙනෙකු සේවය කරන බව සඳහන් කරන ලදී.

තවද දරුවන් සැළකිය යුතු ප්‍රමාණයක් සිටින්නේ නම් ලැබෙන ආදායම ගැටළුවක් නොමැතිව බෙදී යන මුත්, දරුවන් අඩු වීමේදී මෙම ගැටළුවලට මුහුණ දීමට සිදු වන බවත්, මේ වන විට ලැබෙන ආදායමින් 100% ක්ම ගෙවීම් කරන බවත්, මේ සඳහා වෙන විකල්පයක් නොමැති බව සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> දිවා සුරැකුම් මධ්‍යස්ථානය ළමා රක්ෂක දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කිරීමේදී අවශ්‍යශ සුදුසකම් සපුරා ගෙන නොමැති වීමේදී සේවයේ යොදවා ගැනීමේ හැකියාව නොමැති වී යන බවත්, ඒ සම්බන්ධයෙන් ද විශාල ගැටළුවක් පවතින බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

**කාරක සභා අවස්ථාව**

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> මහ සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්කත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී. ඒ අනුව මහ සභාව කාරක සභා අවස්ථාව බවට පත් විය.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> කාරක සභාව මහ සභාව බවට පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.ඒ අනුව කාරක සභාව මහ සභාව බවට පත් වූ අතර දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවන් දෙලපගේ සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා වන පාඨමාලාවක් හැදෑරීම සිදු කර ළමා රක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය කිරීමට සාකච්ඡා කරන ලදී.

තවද කාරක සභා අවස්ථාවේදී දැනට ප්‍රාදේශීය සභාවේ සේවය කරන අනියම් සේවකයින් වසර ගණනාවක සිට සේවය ස්ථිර කර නොමැති වීම සම්බන්ධයෙන් ද සාකච්ඡා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> පළාත් පාලන ආයතනයක් හා වෙනත් රාජ්‍ය ආයතනයක සේවකයින් අතර වෙනසක් පවතින බවත්, රියදුරු සේවය සඳහා වන සුදුසුකම් ඒ අයුරින් තිබිය යුතු වූවත්, අදාල සුදුසුකම් තිබෙන ගලි බවුසරයේ සේවය කිරීමට කැමති රියදුරන් නොසිටින බවත්, තම ගමේ උපන්. ගමේ පදිංචි පළාත්

පාලන ආයතන රියදුරන් අදාල කාර්යය කිසි ගැටළුවක් නොමැතිව ඉටු කරන බවත්. එලෙස කොදිනක හෝ රැකියාව ස්ථිර වේ යයි චේතනාව මත වසර 07,08 වැනි කාලයක්, සේවා කරන බවත්, මෙලෙස සේවා අවශ්‍යතාවය මත වසර ගණනාවක් සේවය කලා නම්, අදාල රියදුරා අතින් කිසිදු වාහනයට හෝ ආයතනයට අගතියක් සිදු වී නොමැතිනම් එවැනි සේවකයින් සේවයේ ස්ථිර කිරීම සම්බන්ධව කිසිදු ගැටළුවක් ඇති කර ගැනීම සුදුසු නොවන බවත්, එසේ නොකර සභාවක් ගෙන යන්නේ කෙසේද යන්නත්, සනීපාරක්ෂක කම්කරු සේවකයින්ද එලෙස අත්‍යාවශ්‍යම කොටසක් බවත්, දියුණු වෙමින් පවතින බල ප්‍රදේශයක් තුල වරිපනම් අය කිරීමට සූදානම් වන පළාත පාලන ආයතනයක් ලෙස ඊට අවශ්‍ය කම්කරු සංඛ්‍යාව මෙම පළාත් පාලන ආයතනය සතු විය යුතු බැවින් මු.රේ 71 අනුව අනුමත කාර්යය මණ්ඩලය සුදුසු පරිදී ඉදිරිපත් කිරීමෙන් පසු අදාල සේවකයින් බඳවා ගෙන ඔවුන්ගේ සේවය ස්ථිර කිරීම සඳහා සභාවේ මැදිහත්වීම අත්‍යාවශ්‍ය බව විශාල වශයෙන් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> රාජ්‍ය තන්ත්‍රය තුල අදාල ස්ථිර කිරීම ක්‍රියාත්මක වන බවත්, දෙපාර්තමේන්තු මට්ටමින් පමණක් මෙම ගැටළුව මතු වී ඇති බැවින් මේ සම්බන්ධයෙන් පාලකයින් වෙත සභාවක් හැටියට බලපෑම් කල යුතු බව සඳහනක් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> අනුමත කාර්යය මණ්ඩලයට අමතරව හා අනුමත නොමැති තනතුරු සඳහා පුද්ගලයින් බඳවා ගැනීම සම්බන්ධව සභාවේ වරදක් පවතින බවත්, සේවයේ අවශ්‍යතාවය මත එසේ බඳවා ගත්තත්, ඔවුන්ගේ අවශ්‍ය සුදුසුකම් නොසලකා බඳවා ගෙන තිබීමද වැරදි සහගත බවත්, ඒ සියල්ල එසේ සිදු වුවත්, මේ වන විට වසර ගණනාවක් සේවය කල සේවකයින් වෙනුවෙන් අසාධාරණයක් සිදු වන බවත්, ඒ වෙනුවෙන් සිදු කල හැකි වන්නේ, අදාල සුදුසකම් සපුරා ගන්නා ලෙසට දැනුවත් කර එය නිවැරදි කර ගන්නා ලෙසත්, එය අවසාන විසඳුවම වන බවත්, සඳහන් කරන ලදී.

**05. ඉඩමේ වැසි ජලය බැස යාමට බෝක්කුවක් ඉදි කිරීම.**

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> අංක 232/11, 2 වන පටුමඟ, පණ්ඩුකාභය මාවත, විජයපුර ලිපිනයේ පදිංචි අනුර ශාන්ත යන අය විසින් සිය ඉඩමට පිවිසෙන ජලය පහතට බැස යාම අවහිර කිරීම නිසා වැසි කාලයේදී සිය ඉඩම හා නිවස ජලයෙන් යට වන බවත්, එය එසේ සිදු වන්නේ සිය ඉඩම හරහා පසුපස නිවස් වලට යාමට සකස් කර ඇති මාර්ගය බොරළු අතුරා උස්සා තිබීම බවත්, මේ හේතුව නිසා ප්‍රධාන මාර්ගයේ ජලයද අවහිර වන බවත්, සඳහන් කරමින් අදාල අතුරු මාර්ගය හරහා කාණුවක් ඉදි කර බොක්කුවක් ස්ථාපිත කර දෙන ලෙසට කරන ලද ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කරන ලද අතර අදාල ස්ථානය තාක්ෂණ නිළධාරීතුමා විසින් නිරීක්ෂණය කර අඩි 1 ½ බෝක්කු බට දෙකක් යෙදිය යුතු බවට නිර්දේශ කර ඇති හෙයින් අදාල බෝක්කුව ස්ථාපිත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> අදාල ස්ථානයේ බෝක්කුව ඉදි කිරීම සිදු කල යුතු කාර්යයක් වන බැවින් එම බොක්කුව ඉදි කිරීම සුදුසු බවට ගරු උප සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> හියුම් පයිප්ප මිලදී ගෙන කාර්මික නිළධාරීගේ නිර්දේශය මත බෝ්කු ස්ථානගත කිරීමේදී පෞද්ගලික ඉඩම් වලට ප්‍රවිශ්ය වීම සඳහා යෙදිය හැකිද යන්න විමසන ලද අතර එවැනි ස්ථාන පවතින බැවන් පසුගිය වසර තුල ප්‍රාදේශීය සභාව විසින් මිල දී ගනු ලැබූ හියුම් පයිප්ප පිළිබඳ විස්තර වාර්ථාවක් ඊළඟ මහ සභාවේදී ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> ඊළඟ මහ සභාවේදී අදාල විස්තරය ලබා දීමට කටයුතු කරන බව ප්‍රකාශ කරමින්,ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අංක 232/11, 2 වන පටුමඟ, පණ්ඩුකාභය මාවත, විජයපුර

ලිපිනයේ පිහිටි  අතුරු මාර්ගය ඉදිරියෙන් බෝක්කුවක් ස්ථාපිත කිරීමේ  ලබා දීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**06. බොරළු අතුරා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.**

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> දෛනිකව විශාල පිරිසක් භාවිතා කරන පහත සඳහන් මාර්ග දීර්ඝ කාලයක් සිට කිසිඳු ප්‍රතිසංස්කරණයක් සිදු කර නොමැති මාර්ග වන අතර අදාල අළුත්වැඩියාවන් සිදු කර දෙන ලෙසට ගරු මන්ත්‍රී කේ.බී හැරිසන් මැතිතුමා විසින් කර ඇති ඉල්ලීම් ලිපි මහ ස භාවට ඉදිරිපත් කරමින්  කර ඇති හෙයින් අදාල මාර්ග අළුත්වැඩියා කර දීම සුදුසු බවට  යෝජනා කරන ලදී.

01. ඉත්තෑවැව ළඟ සිට සුචරිතගම දක්වා මාර්ගය සහ එහි දෙපස මාර්ග
02. ග්‍රෑන්ඩ් එක අසල සිට ඇඳගල පන්සල පාර
03. යොවුන් සේනාංකය අසල සිට ප්‍රසන්න මහතාගේ ගෙවල් දක්වා මාර්ගය.

<u>ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා</u>  මේ සම්බන්ධව ගරු සභාපතිතුමා සමඟ සාකච්ඡා කල බවත්, ඉත්තෑවැව වැව ස්මත්තේ, පවතින බොරළු කොටසේ බොරළු සභාව සතු වාහන භාවිතා කරමින් ලබා ගෙන අදාල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂාවෙන් සිටින බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> අදාල මාර්ග ප්‍රතිසංස්කරණය සභාවට අයත් වාහන ඉන්ධන සමඟ යොදා ගනිමින් සිදු කර දීම සුදුසු බව ප්‍රකාශ කරමින් ගරු උප සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනා ව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසු  අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ගරු මන්ත්‍රී කේ.බී හැරිසෙන්ස් මැතිතුමා විසින් ඉල්ලීම් කළ මාර්ග ඉත්තෑවැව වැව ස්මත්තේ, පවතින බොරළු කොටසේ බොරළු සභාව සතු වාහන ඉන්ධන සහිතව  භාවිතා කරමින් අදාල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**07. පදිංචි ඉඩම් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම.**

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> අංක 134, 9 ඇල පාර, වන්නියම්කුලම, විජයපුර ලිපිනයේ පදිංචි නදීකා සුභාෂිණී තිලකරත්න යන අය විසින් සිය ඉඩමට ඇතුළුව පුද්ගලයින් 03 දෙනෙකුගේ ඉඩම් වලට යාම සඳහා වූ අතුරු මාර්ගය පිළිසකර කර නොමැති බැවින්, වර්ෂා කාලයේදී දැඩි දුෂ්කරතා වලට ලක් වන බව, සඳහන් කරමින්  මෙම මාර්ගයට කාණු යොදා බෝක්කුවක් ඉදි කර බොරළු අතුරා දෙන ලෙසට කර ඇති ඉල්ලීම් ලිපිය මහ සභාවට ඉදිරිපත් කරමින්  අදාල මාර්ගය ප්‍රතිසංස්කරණය කර දීම සුදුසු බවට යෝජනා කරන  ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> වන්නියම්කුලම කොට්ඨාශය තුල විශාල වශයෙන් ඉඩම් කට්ටි වෙන් වන බැවින් මෙය විශාල ගැටළුවක්ව පවතින බැවින්  එහිදී බෝක්කුවක් හෝ නිසි පරිදී සකස් කල මාර්ගයක් නොමැති වන බවත්. එලෙස අතුරු මාර්ග 24 ක් මේ වන විට කොට්ඨාශය තුල පවතින බවත්. මේ සඳහා විසඳුම වශයෙන් අදාල මාර්ග බෝක්කුවක් සමඟ පිළිසකර කල යුතු බව ප්‍රකාශ කරන ලද අතර ඉල්ලීම කල මාර්ගය බෝක්කුවක් දමා පිළිසකර කර දීම සුදුසු බවට ගරු උප සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අංක 134, 9 ඇල පාර, වන්නියම්කුලම, විජයපුර ලිපිනයේ පිහිටි අතුරු මාර්ගය පිළිසකර කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර , අදාල අතරු මාර්ග සම්බන්ධයෙන් තාක්ෂණ නිළධාරීතුමා සමඟ සාකච්ඡා කර වාර්ථාවක් ලබා ගැනීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

**08.** **අතුරු මාර්ගයට බොක්කුවක් ලබා ගැනීම.**

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා කළුආරච්චියාගම, හිදෝගම, අනුරාධපුර ලිපිනයේ පදිංචි අයිරාංගනී පුෂ්පලතා මහත්මිය විසින් සිය නිවසට හා අනෙකුත් අසල් වැසි නිවාස සඳහා පිවිසෙන අතුරු මාර්ගය වැසි කාලයේදී ජලය බැහැර වීම සඳහා නිසි පරිදී බෝක්කු පද්ධතියක් නොමැති වීම හේතුවෙන් ගමනාගමනය සඳහා දැඩි දුෂ්කරතාවයන්ට පත් වන බවටත්, එම ජලපහර සිය ඉඩම ඉදිරියෙන් මාර්ගය හරහා ගමන්කර සිය නිවස හරහාද ගමන් කරන අතර ඒ හේතුවෙන් නිවසද අබලන් වී ඇත. එබැවින් වැසි කාලයේදී අප දැඩි අපහසුතාවයකට පත් වේ. මේ ගැන සලකා බලා එම අතුරු මාර්ගයේ ජලය අවහිර වන ස්ථානයට බෝක්කු බට දෙකක් යොදා දෙන මෙන් කර ඇති ඉල්ලීම් ලිපිය මහ සභාවට ඉදිරිපත් කරමින් අදාල මාර්ගයට බෝක්කුවක් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා මීට පෙර අවස්ථාවකදීද මෙම ලිපිය ඉදිරිපත් කලත්, මේ වන තෙක් ඉටු වී නොමැති බැවින් මෙය නැවත ඉදිරිපත් කල බවත්. මේ සඳහා බෝක්කුව ඉදි කිරීම අත්‍යාවශ්‍ය බව සඳහන් කරමින් එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු උප සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් කළුආරච්චියාගම, හිදෝගම, අනුරාධපුර ලිපිනයේ පිහිටි අතුරු මාර්ගයට බොක්කුවක් ස්ථාපිත කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** **ශාන්තිවාදී පෙර පාසලේ සෙල්ලම් මිදුල ඉදි කිරීම**

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා මගින් ශාන්තිවාදී පෙර පාසලේ සෙල්ලම් මිදුල සඳා ගැනීමට පෙර පාසල් භූමියට පස් දමා ගොඩකර ගත යුතු වන බවත්, සිඟිති දූ දරුවන්ගේ මුල් ළමා විය සංවර්ධන සිදුවන සෙල්ලම් මිදුල සකස් කර ගැනීමට අවශ්‍ය වන භූමිය සකස් කර ගැනීම සඳහා භූමියට පස් පුරවා තුනී කර දෙන ලෙසට කර ඇති ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කරමින් අදාල කාර්යය ඉටු කර දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා රජය මගින් විශාල ප්‍රතිපාදන වෙන් කරමින් ඉදි කල මෙම පෙර පාසලේ දොර නිසි පරිදි සකස් කර නොමැති බවත්, විදුලි සම්බන්ධතාවයක් මෙතෙක් නොමැති බවත්, දැනට සෙල්ලම් මිදුල සඳහා බොරළු ලෝඩ් 03 ක් ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බැවින් එය ඉටු කර දීම සුදුසු බවට ගරු උප සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා අදාල පෙර පාසල් භූමිය ගරු මන්ත්‍රීතුමා සඳහන් කල පරිදී දරුවන්ට ක්‍රිඩා කල හැකි තත්වයේ නොපවතින බැවින් පස් පුරවා සෙල්ලම් මිදුල සකස් කර දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අදාල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතා පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ශාන්තිවාදි පෙර පාසලේ සෙල්ලම් මිදුල සඳහා බොරළු අතුරා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** **මඩවලගම පාසල අසල පෙට්ටි බොක්කුව හා පාවක්කුලම පෙට්ටිකඩේ අසල පෙට්ටි බොක්කුව ඉදි කිරීම.**

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා මඩවලගම පාසල අසල පෙට්ටි බොක්කුව හා පාවක්කුලම පෙට්ටිකඩේ අසල පෙට්ටි බොක්කුව ඉදි කිරීම සම්බන්ධයෙන් වන පිළිවෙළින් රු 221,956.30 ක් හා රු 121,908.28 ක ඇස්තමේන්තු මහ සභාවට ඉදිරිපත් කරමින්, ඇස්තමේන්තු ප්‍රකාරව අදාල බෝක්කු ඉදි කිරීම කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා අදාල බොක්කු හරහා ගොවි ජනතාව විශාල සංඛ්‍යාවක් ගමන් ගන්නා බැවින් අදාල බොක්කු සභා අරමුදලින් ඉදි කිරීම සුදුසු බවට ගරු උප සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් මඩවලගම පාසල අසල පෙට්ටි බොක්කුව හා පාවක්කුලම පෙට්ටිකඩේ අසල පෙට්ටි බොක්කුව ඉදිරිපත් කල ඇස්තමේන්තු ප්‍රකාරව කොන්ත්‍රාත් පදනමින් ඉදි කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

**2021 පෙබරවාරි මස 10 වන දින මුදල් කමිටු වාර්ථාව**

සභා ගත කිරීම සිදු කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා පසුගිය වසර කිහිපය පුරා අප ඉදිරිපත් කල යෝජනා ගණනාවක් තිබුනා වුවත්, ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන අවස්ථාවේදී පමණක් කතා කරනවා හැර ඉදිරි ක්‍රියාමාර්ග නොගන්නා බවත්, ශ්‍රාවස්තිපුර , කොඩිගල මාර්ගය සකස් කර දීම සම්බන්ධයෙන් විශාල ඉල්ලීම් ප්‍රමාණයක් කලත් එය තවම සකස් කර ගත නොහැකි වූ බවත්, එම මාර්ගය කාපට් කිරීමට නියමිත බව ප්‍රකාශ කර ඇතත්, එය එසේ සිදු වන තෙක් මාර්ගය මෝටර් ග්‍රේඩර් හෝ කර දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

තවද , තුරුවිල මාර්ගයේ පාලම .12 ඇල කළුආරච්චියාගම පාලම තුල දැඩි අනාරක්ෂිත බවක්, පවතින බවත්, අදාල මාර්ග පවා දැඩි හානියකට ලක් වී ගමන් ගත නොහැකි තත්වයේ පවතින බැවින්, මේ සඳහා වලවල් ටික හෝ වසා දීම සුදුසු බවත්, මෙම මාර්ගයද කාපට් වන බවට සඳහන් වන බවත්, එහි සත්‍යතාවයක් පවතින්නේද? මාර්ගය ඉදි නොකර පාලම ඉදි කිරිමට නිර්දේශ කිරීම තුල සිදු වන්නේ කුමක්ද යන්නත් විමසන ලද අතර, අදාල කාපට් කිරීම සිදු වන තෙක් මාර්ගයේ වලවල් වසා දැමීම සිදු කල යුතු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා කොඩිගල මාර්ගය යහපාලන රජය මගින් මුල් ගල් තැබූ මුත් එය ඇස්තමේන්තුවක් වත්, සකස් නොකර ඉටුකල කාර්යයක් බවත්, මේ වන විට ආර්.ඩී.ඒ යටතේ වර්ථමාන ආණ්ඩුව විසින් කොඩිගල මාර්ගය සකස් කිරීමේ යෝජනාව සම්මත කර ඇති බැවින් ඉදිරියේදී ඇස්තමේන්තු සකස් වනු ඇති බවත්, ඉන් අනතුරුව ප්‍රසම්පාදන කාර්යය සිදු වන බවත්, පාලම් ව්‍යාපෘතිය තුල පාලම් 500 ව්‍යාපෘතිය යටතේ මල්වතු ඔය හරහා දිවෙන පාලම ඉදි කිරීමට නියමිත බවත්, කොඩිගල මාර්ගය කාපට් වන තුරු මෝටර් ග්‍රේඩර් කර දීම හෝ සිදු කල හැකි නම් සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා කළුගල් කර්මාන්තයේ නිරත වී සිටින පුද්ගලයින් හට බද්දක් නිර්මාණය කර එවා ඇති බවත්, මේ වන විට කළු ගල් වැඩපලවල් වල කාර්යයන් විශාල වශයෙන් නතර වී ඇති බවත්, එහි සිටින සේවකයින්ගේ ජන ජීවිතය අඩාල වී ඇති බැවින් සභාවක් ලෙස අප මේ බද්ද වෙනුවෙන් සාධාරණ විසඳුමක් ඉල්ලීමේ වගකීම පවතින බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර ඒ සඳහා වන යෝජනාවක් සභාව හරහා අදාල ආයතන වලට යොමු කල යුතු බව සඳහන් කරන ලදි.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා පසු අවුරුදු සැළැස්ම යටතේ දිවෙන මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන තෙක් කුමන හෝ වැඩ සටහනක් යටතේ කොට්ඨාශ මට්ටමින් ගමන් කල නොහැකි මාර්ග හඳුනාගෙන මෝටර් ග්‍රේඩර් හෝ බෙරළු ඇතිරීම සිදු කර  වලවල් වසා දීම සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා තාක්ෂණ කමිටුවේදී සාකච්ඡා කර ඇති මල්වතු ඔය හරහා දිවෙන විජයපුර හා නෙළුබැව නගර යා කරන පාලම ඉදි කිරීම සම්බන්ධයෙන් තමන් ගරු සභාපතිතුමා හා ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා සමඟ පෞද්ගලික ව මැදිහත් වී අනුමත කර ගත් බවත්, එය මේ නගර දෙක යා කරන කෙටිම මාර්ගය වන හා දැඩි වටිනාකමක් සහිත පාලමක් වන බව ප්‍රකාශ කරමින් නුදුරේදී අනිවාර්යෙන් ඉටු වන බවව ප්‍රකාශ කරන ලදී.

තවද තාක්ෂණික කමිටුව හරහා ලබා දුන් තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා තමන් අනිවාර්යෙන් කටයුතු කරන බවද සඳහන්  කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා තණකොල කපන යන්ත්‍රයක් මිල දී ගැනීම සඳහා මුදල් කමිටුවේ ලබා ගෙන ඇති නිර්දේශය වඩාත් සුදුසු බවත්, ඒ සම්බන්ධයෙන් සතුටු වන බවත්. වාහන සේවා මධ්‍යස්ථානය වෙනුවෙන් පරිසර බලපත්‍රය ඉතාම ඉක්මනින් ලබා ගැනීමට කටයුතු කරන ලෙසත්, නාච්චාදූව ව්‍යාපාරය යටත් පවතින නාන තොටුපල හා වාහන නැවතුම්පල මේ වන විට  වාරි මාර්ග අමාත්‍යතුමා තුමාගෙන් අවසර ලබා ගෙන සභාව යටතට ගැනීම සුදුසු බවට යන්න වර්ථාවේ සඳහන් විය යුතු බවත්, පාලම් ව්‍යාපෘතිය ස්විඩන් ආණ්ඩුව යටතේ වූ යෝජනා බවත්, අදාල ව්‍යාපෘතිය යටතේ පැමිණි පාලම් වෙනත් ස්ථානයකට ආදේශ කල නොහැකි බවත්, අදාල පාලම් පරීක්ෂණ ගණනාවක් සිදු කර නව තාක්ෂණය ඔස්සේ සැළැස්ම සකස් කර ඇති බවත් සඳහන් කරන ලදී.

තවද මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත නොවී මාර්ගයක් ඉදි කිරීම වෙනුවෙන් මුල් ගල් තැබීමේ උත්සව පැවැත්විය නොහැකි බවත්, මීට ඉහත යහපාලන ආණ්ඩු කාලය තුල කොඩිගල මාර්ගය , ආලංකුලම මාර්ගය, කීරික්කුලම මාර්ගය  හා තරියන්කුලම මාර්ගය යන මාර්ග වලට මුදල් වෙන්වුනු බවත්, ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර මුල් ගල් තැබූ නමුත් අනුමත වූ මුදල් ප්‍රසම්පාදන කාර්යයෙන් පසු කොන්ත්‍රාත් කරුවන්ට දීමට ප්‍රථම මැතිවරණ කලබැගැනිය සිදු වී ව්‍යාපෘති නතර වී ඇති බවත්, වර්ථමානය වන විට පැරණි ඇස්තමේන්තුවට මාර්ග ඉදි කල නොහැකි වීම මත නව ඇස්තමේන්තු සකස් කල යුතුව පවතින බවත්, සඳහන් කරමින් දොස් කියනවාට වඩා බල ප්‍රදේශයේ මිනිස් අවශ්‍යතා වෙනුවෙන් වැඩ කරනවානම් එය අපගේ ජයග්‍රහණය බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2021 ජනවාරි මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

**නැත.**

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ දන්නා හා නොදන්නා කරුණ සම්බන්ධයෙන් විවිධ අදහස් සියළු දෙනාම එක්වී යහපත් චේතනාවෙන් යුතුව ඉදිරිපත් කල ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2020.02.19 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 12.10 ට අවසන් කරන ලදී.

| | |
|---|---|
| ..................................... | .......................................... |
| යූ.ඒ ධම්මික, | එම් සරත් ප්‍රේමචන්ද්‍ර, |
| ලේකම්, | උප සභාපති , |
| නැ.නු.ප ප්‍රාදේශීය සභාව, | නැ.නු.ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |